ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

කුසලතා කැප්ස්ටෝනය - ජූලි 2018

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

---

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රධාන අරමුණ වන්නේ තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳව අයදුම්කරුවන්ගේ සමස්ත දැනුම, කාර්යාල යෙදවුම් මෘදුකාංග කෙරෙහි වැඩි සැලකිල්ල ඇතිව කාර්යාල පරිසරය තුළ යෙදවීම පරීක්ෂා කිරීමය. මෙම ප්‍රශ්න පත්‍රයට සාර්ථකව මුහුණ දී උත්තර ලිවීමට, කාර්යාල පරිසරයක තොරතුරු තාක්ෂණය යෙදවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම ඉතා වැදගත් බව සැලකිය යුතුය.

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න විස්සකි (20)

(මුළු ලකුණු 40)

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී ඇත්තේ වර්ගීය තොරතුරු තාක්ෂණය සහ කාර්යාල වැඩ සම්බන්ධිත මොඩියුල කෙරෙහිය. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ එයට උත්තර සපයා තිබූ අතර, වෙන්කළ ලකුණුවලින් 20 ත් 30 ත් අතර ලකුණු උපයා ගැනීමට ඔවුන්ගෙන් බහුතරය සමත්විත විය. ප්‍රශ්න අංක **1.11** සිට **1.16** දක්වා වූ දෙනලද වචන අතුරෙන් නිවැරදි වචනය තෝරාගැනීමේ ප්‍රශ්නවලදී බහුතරය සාර්ථක වූ බව පෙනී ගියේය. පහසුවෙන් මෙම විෂය සමත්වී තිබුණේ මෙම ප්‍රශ්නයට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන්ය.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායකය.**

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 60)

## ප්‍රශ්න අංක 02

දත්ත පදනම් කළමනාකරණය සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා පිළියෙල කළ ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙකුට **(a)** හා **(b) කොටස්වලට** නිවැරදිව උත්තර ලිවීමට හැකිවිය. තෝරා ගැනීමට තුඩුදුන් හේතු දක්වමින් ප්‍රධාන ක්ෂේත්‍රය ලෙස සැලකීමට වඩාත්ම සුදුසු ක්ෂේත්‍රය නිවැරදිව ඔවුන් හඳුනාගෙන තිබුණි. "ජාතික හැඳුනුම්පත් අංකය" හා "උපරිම අතිකාල පැය" ක්ෂේත්‍ර සඳහා නිවැරදි දත්ත වර්ගය හඳුනා දැක්වීමට නොහැකිව තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකට ය. ඔවුන් වැරදි ලෙස ජාතික හැඳුනුම්පත් අංකය සඳහා "අංකය" යන්නද, උපරිම අතිකාල පැය සඳහා "දිනය / කාලය" යන්නද ලියා තිබුණි.

**(c) කොටස** සඳහා, දත්ත පදනම් සඳහා විමසුම් ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයට නොහැකි විය. විමසුම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඔවුන්ට තිබුණේ නැත. දත්ත පදනම් තාක්ෂණය අධ්‍යයනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් ඔවුන් විසින් යොමුකළ යුතුව තිබේ.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායකය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලද්දේ දෙන ලද පැතුරුම්පතක මූලික ගණනය කිරීම් ඉටුකිරීම සඳහා සූත්‍ර හඳුනා ගැනීමට අයදුම්කරුවන්ගේ හැකියාව පරීක්ෂා කිරීමය. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි. (a) **කොටස** සඳහා අදාල කරගතයුතු සූත්‍රයේ නියත යොමු නිවැරදිව සඳහන් කිරීමට හැකිවූයේ ඉතාමත් සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවකට පමණි. (b) සහ (c) **කොටස්** සම්බන්ධයෙන්, සමහර අයදුම්කරුවන්ට සූත්‍රය නිවැරදිව හඳුනාගැනීමට සහ If ශ්‍රිතය (If function) භාවිත කර තර්කානුකූල පරීක්ෂාව ඉටුකිරීමට දුෂ්කරතා තිබූ බව පෙනුණි. (b) සහ (c) **කොටස්** සඳහා යොදාගත් සූත්‍රවල දෝෂ ගණනාවක් තිබූ බව දක්නට ලැබුණි.

(d) **කොටස** සඳහා ද දෙනු ලැබූ ශ්‍රිතයන් සඳහා ප්‍රතිඵල වූ අගයන් හඳුනාගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයකට නොහැකි විය. අයදුම්කරුවන් විසින් මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිළිබඳ ප්‍රායෝගික දැනුම වැඩිපුර ලබාගැනීම කෙරෙහි යොමුවිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය මධ්‍යස්ථ විය.**

## ප්‍රශ්න අංක 04

කාර්යාලීය පරිසරයක සන්නිවේදනය කිරීම සඳහා විද්‍යුත් තැපැල් යැවීම පිළිබඳව අයදුම්කරුවන්ගේ හැකියාව පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. සියලුම අයදුම්කරුවන් වාගේ මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි. තවද, විකල්ප ප්‍රශ්න 6 අතුරෙන් වඩාත් හොඳින් කාර්යසාධනය තිබූ උත්තරය මෙය විය. බොහෝදෙනා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වූ අතර, සුදුසු විද්‍යුත් තැපැල් අත්සන් පාඨයක් නොයෙදීමේ හේතුවෙන් කීප දෙනෙකු ප්‍රශ්නයේ තිබූ ඇමුණුම් ගොනුවම උත්තරයට අදාල ඇමුණුම් එනම්, "GCELAL.PDF" ලෙස දක්වා තිබුණි.

විද්‍යුත් සන්නිවේදනය ප්‍රායෝගිකව අත්හදා බැලීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුවත්භාවය තවදුරටත් වැඩිවීමට හේතුවනු ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය විශිෂ්ඨ විය.**

## ප්‍රශ්න අංක 05

පිරික්සීමේ වින්ඩෝස්, VPN, අන්තර්ජාල බැංකුකරණය සහ QR codes වැනි විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම මෙයින් පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන්ගෙන් බහුතරය මේ සඳහා උත්තර ලියා තිබුණි.

(a), (b) සහ (c) **කොටස්** සඳහා කාර්යසාධනය සතුටුදායක වුවද, (d) සහ (e) **කොටස්** සඳහා නිවැරදි ලෙස උත්තර සැපයීමට හැකි වුනේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකට පමණි.

(b) **කොටස** සඳහා "ප්‍රතිවේශනය" (reload) යන විකල්පය භාවිත කරනු ලබන්නේ ජංගම දුරකතන සම්බන්ධතා සඳහා මුදල් එකතු කිරීමට යනුවෙන් සඳහන් වූ උත්තර කීපයක්ද විය.

(d) **කොටස** සම්බන්ධයෙන්, දී තිබූ ප්‍රකාශනය සම්බන්ධව බොහෝ අයදුම්කරුවන් එකඟ නොවන බව සඳහන් විය. මේ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම යාවත්කාලීන විය යුතුය. මාර්ගගත බැංකු ගනුදෙනුවලදී ඇඟිලි සළකුනු වලංගුකරණය භාවිත වන බව ඔවුන් නොදැන සිටිබව උත්තර අනුව දක්නට ලැබුණි.

(e) **කොටස,** සම්බන්ධයෙන් QR code / 2D Barcode උත්තරය ලෙස නිවැරදිව හඳුනා දැක්වීමට හැකිව තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවකටය. එහෙත් ඒවායේ භාවිතය සඳහා උදාහරණ දැක්වීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයකට හැකිවිය.

තාක්ෂණික පරිසරයට නිරතුරුවම අලුත් දේවල් එකතුවන බැවින් තම දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීමට අයදුම්කරුවන් අවදියෙන් සිටිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායකය.**

## ප්‍රශ්න අංක 06

දෙන ලද පත්‍රිකාවේ දී තිබෙන එක් එක් මූලිකාංග අනුවර්තනය කිරීමට භාවිත කරනු ලබන මයික්‍රොසොෆ්ට් වර්ඩ් අංග හඳුනා දැක්වීම අවශ්‍යකරන ලදී. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. කෙසේ වෙතත්, සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයේ දී තිබූ උපදෙස් වරදවා තේරුම්ගෙන තිබූ බව පෙනී ගියේය.

ප්‍රශ්නයෙන් අවශ්‍ය කළ දෙය තේරුම් ගැනීම සඳහා උදාහරණයක් දී තිබුණ නමුත් ඒවාට අවධානය යොමු නොකොට, අයදුම්කරුවන් පත්‍රිකාව මුල සිටම නිර්මාණය කිරීමට උත්සාහ කර ඇත. උදාහරණයක් වශයෙන් **(a) කොටස** සඳහා, අවශ්‍යව තිබුණේ "REEMIX MID - Year Clearance Sale" යන පාඨයේ පෙනුම වෙනස් කිරීමට වුවද අයදුම්කරුවන් සමස්ත පත්‍රිකාව වෙනස් කිරීමට ගතයුතු පියවර දක්වා තිබුණි.

උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය ප්‍රවේසමෙන් කියවා තේරුම් ගැනීම පූර්ව මූලික අවශ්‍යතාවයකි. කෙසේවුවද, **(b) කොටසට** සහ **(f) කොටසට,** වෙන්කර තිබූ ලකුණු ලබාගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරය සමත්විය. උත්තර අනුව පෙනී ගියේ බොහෝ අයදුම්කරුවන් මයික්‍රොසොෆ්ට් වර්ඩ්වල "Drop Cap" වැනි ලක්ෂණ සහ "Crop" වැනි උපකරණ පිළිබඳව දැනුවත් වී නොතිබූ බවය.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට තිබුණේ නැත.**

## ප්‍රශ්න අංක 07

ඉදිරිපත් කිරීමේ මෘදුකාංග ගැන අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේ අයදුම්කරුවන්ගෙන් වඩා අඩු සංඛ්‍යාවකි. ඔවුන් අතුරෙන් ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණක් සාධාරණ මට්ටමේ ලකුණු උපයා තිබුණි. අයදුම්කරුවන්ට උත්තර ලිවීමට හැකිවී තිබුණේ **(a) කොටසේ, උප කොටස් (iv)** සහ **(vi)** ට පමණි. මෙයද අදාල ලක්ෂණයේ නමේ තේරුම අනුමාන කිරීමෙන් බව පෙනුණි. එහෙත්, ඉතිරි උපකොටස් සඳහා උත්තර සතුටුදායක වූයේ නැත.

**(b) කොටස** සඳහා, සමහර අයදුම්කරුවන් උත්තර ලියා තිබුණේ යතුරු පුවරුව යොදාගෙන ඉදිරිපත් කිරීම ආරම්භ කළ හැකි බවය. එහෙත් කවර නිශ්චිත යතුරු සංයෝගයදැයි සඳහන් කිරීමට ඔවුන්ට නොහැකි විය. ප්‍රධාන වචන (key words) කෙරෙහි වැඩි අවධානයක් සහිතව PowerPoint ලක්ෂණ පිළිබඳව ඔවුන්ගේ අවධානය වැඩි දියුණු කර ගැනීම අවශ්‍ය වේ.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය ඉතාමත් දුර්වල විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකිරීම.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කිරීම.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කර ගැනීම.
7. කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එනම්, එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත නොකිරීම.
8. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක/විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
9. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -